(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(4).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2023 අගෝස්තු 25 සිකුරාදා

---

## 2023 සැප්තැම්බර් 05 අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජුනි 28 දිනැති අංක 2338/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූලි 20 දිනැති අංක 2341/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.22 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 26, 31(ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) වගන්ති සමඟ කියවිය යුතු 117(2)(ට) වගන්තිය යටතේ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අප්‍රේල් 03 දිනැති අංක 2326/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා,— සමාගම් පනත යටතේ නියෝග,— 2007 අංක 07 දරන සමාගම් පනතේ 222 වගන්තිය සමඟ කියවිය යුතු 527 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 මාර්තු 17 දිනැති අංක 2323/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මහජන ආරක්ෂක අමාත්‍යතුමා,— පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වගන්තිය යටතේ මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් 2023 අගෝස්තු 09 දින සාදන ලදුව, 2023.08.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***